# ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව

# තනතුරු ඇබෑර්තු

2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පනත මගින් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව මෙරට බහුවිධ යටිතල පහසුකම් නියාමන ආයතනය වශයෙන් ස්ථාපිත කර ඇත. 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත සම්මත කිරීමෙන් අනතුරුව කොමිෂන් සභාව විදුලිබල කර්මාන්තයේ ආර්ථික, ආරක්ෂණ හා තාක්ෂණ නියාමන ආයතනය වශයෙන් ක්‍රියාත්මක වේ.

## (01) සහකාර අධ්‍යක්ෂ - නීති (කොන්ත්‍රාත් පදනම මත සංඛ්‍යාව 01)

**අ) වාර්තා කිරීමේ සම්බන්ධතාවය**

- ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ ලේකම් වෙත

**ආ) තනතුර මගින් අපේක්ෂිත අරමුණ**

- එදිනෙදා කටයුතුවලදී නීතිමය සහයෝගය ලබාදීම

**සුදුසුකම්**

- නීතිඥවරයෙකු වීම

**පළපුරුද්ද**

- සිංහල සහ ඉංග්‍රීසි යන භාෂා ද්විත්වයෙන්ම කටයුතු කිරීමට බලපත්‍ර සහිත නොතාරිස්වරයෙකු වීම.
- නෛතික ලියකියවිලි සහ ගිවිසුම් කෙටුම්පත් කිරීම ඇතුළු සියලුම ආකාරයේ නෛතික කාර්යයන් මෙහෙයවීම සඳහා වසර තුනකට නො අඩු වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.
- ආරවුල් නිරාකරණයේ හා බේරුම්කරණය පිළිබඳ පළපුරුද්ද
- නියාමන කටයුතු පිළිබඳ පළපුරුද්ද අමතර සුදුසුකමක් වේ.

**වයස් සීමාව -** මෙම දැන්වීම පළකරන දිනට අවුරුදු 35ට වඩා අඩු විය යුතු ය.

## (02) කළමනාකරණ සහකාර (තනතුරු සංඛ්‍යාව 01)

**(අ) වාර්තා කිරීමේ සම්බන්ධතාවය**

© THE ASSOCIATED NEWSPAPERS OF CEYLON LTD.ALL RIGHTS RESERVED.

- සහකාර අධ්‍යක්ෂ-බලපත්‍ර වෙත

**(ආ) සුදුසුකම්**

- අ.පො.ස. උසස් පෙළ භෞතික විද්‍යා ධාරාවෙන් එක් වාරයකදී විෂයයන් 3ක් සමත් වීම (සාමාන්‍ය දැනුම හා පොදු ඉංග්‍රීසි යන විෂයයන් හැරුණු විට)

සහ

- අ.පො.ස. සාමාන්‍ය පෙළ ඉංග්‍රීසි, සිංහල / දෙමළ භාෂාවන් සහ ගණිතය විෂයයන්ට සම්මාන සහිතව එක් වරකදී විෂයන් 6ක් සමත් වී තිබීම

**(ඇ) අවශ්‍ය පළපුරුද්ද සහ නිපුණතා**

- දත්ත විශ්ලේෂණය පිළිබඳ පළපුරුද්ද
- සන්නිවේදන හැකියාව
- විදුලිබල කර්මාන්තයේ හෝ නියාමන ආයතනයක පළපුරුද්ද අමතර සුදුසුකමක් වේ.

**(ඈ) වයස**

- මෙම දැන්වීමේ දිනයට වයස අවුරුදු 18ත් 30ත් අතර වීම

ඉහත තනතුරු සඳහා ආකර්ෂණීය වැටුප් හා ප්‍රතිලාභ හිමි වේ. සුදුසුකම් සහ පළපුරුද්ද අනුව කෙටි ලැයිස්තුගත කරන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවන අතර, සම්මුඛ පරීක්ෂණයේදී දක්වන හැකියාවන් මත පදනම් ව තෝරාගැනීම සිදු වේ.

අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, දුරකථන අංක, උපන් දිනය, වයස, පුරවැසිභාවය, අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් සහ වෙනත් තොරතුරු සහ අයදුම්කරු පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කළ හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම්, දුරකථන අංක ඇතුලත් කරන ලද. අයදුම්පත් 23.01.2020 වැනි දින හෝ එදිනට පෙර එවිය යුතු වේ. අයදුම්පත එවන ලිපි කවරයේ වම්පස ඉහළ කොටසේ හෝ ඊමේල් පණිවිඩයේ විෂය තීරයෙහි අයදුම්කරන තනතුර සඳහන් කළ යුතු ය.


සභාපති

**ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව**

6 වන මහල, ලංකා බැංකු වෙළඳ කුළුණ, 28, ශාන්ත මයිකල් පාර,
කොළඹ - 03.

දුරකථනය: 011-2392608/7 ෆැක්ස්: 011-2392641
ඊමේල්: careers@pucsl.gov.lk වෙබ්අඩවිය: www.pucsl.gov.lk


08.01.2020

Source: Diniamina, Daily News (2020.01.08)